# Abstract 16

# බුද්ධචරිතයෙන් පිළිබිඹු වන නායකත්ව ලක්‍ෂණ

**පූජ්‍ය. වේඬරුව් සිරිසුමන හිමි,**
(ශාස්ත්‍රවේදී (විශේෂ) තෙවන වසර - බෞද්ධ දර්ශනය),
*sirisuman777@ gmail.com*

බුදුන් වහන්සේ හැඳින්වීම සඳහා පෙළෙහි **නායකො, ලොකනාථො, විනායකො, පුබ්බඞ්ගමො** යනාදී විශේෂණ පද රාශියක් යෙදී ඇත. මේවා පෙළෙහි දක්නට ලැබෙන අර්ථශූන්‍ය භාවිත නොවේ. ඒවා සියල්ල උන්වහන්සේගේ නායකත්ව ලක්ෂණ හා සම්බන්ධ වූ ඒවා ය. බුදුන් වහන්සේ එසේ හැඳින්වීමට බලපෑ පසුබිම ද පෙළෙහි දක්වා තිබීම වැදගත් කරුණකි. නිදසුනක් ලෙස කිසියම් පිරිසකට නායකත්වය දක්වන තැන්වල දී "**පරිසාය නායකො**" යනුවෙන් යොදා තිබේ. විශිෂ්ට කායික පෞරුෂත්වයකින් හෙබි (රූපග්ගප්පත්තො) පුද්ගල චරිතයක් වන බුදුන් වහන්සේ ලොව අසමාන ආධ්‍යාත්මික පෞරුෂයකින් යුක්ත වූහ. එබැවින් නායකත්වයේ සුවිශේෂ පදනමක් බුදුන් වහන්සේ සතු විය. අනෙක් අතින් සංකීර්ණ ආගමික හා දාර්ශනික පසුබිමක් සහිතව තිබූ ක්‍රි. ව. 6 සියවස භාරතයේ ප්‍රතිශ්‍රෝතගාමී නව දර්ශනයක් හඳුන්වා දෙමින් විශාල සංඝ සංස්ථාවක් සහ අනුගාමිකයන් පිරිසක් පාලනය කිරීමට හා එය ස්ථාපනය කිරීමට බුදුන් වහන්සේ කටයුතු සම්පාදනය කළහ. මෙම කාර්යය සඳහා බුදුන් වහන්සේගේ අද්විතීය නායකත්වය ඉවහල් වූ බව පැහැදිලි කරුණකි. නායකත්වයේ ප්‍රමුඛ ලක්ෂණයක් වන්නේ බලය යි. බලය එක් පුද්ගලයෙකු වටා කේන්ද්‍රගත වීම මෙන් ම බලය විමධ්‍යගත වීමත් නිසා ලෝකයේ බිහිවුණු අර්බුද රාශියක් වේ. බුදුන් වහන්සේ එකී අධිකාරීමය බලය ධර්මය වටා කේන්ද්‍රගත කිරීම සුවිශේෂ කරුණකි. මෙම නායකත්ව ලක්ෂණ පිළිබඳ අන්‍යාගමිකයන් අතර පවා ඇගයීමට භාජනය වී ඇත. **දීඝනිකායේ** සෝණදණ්ඩ වැනි සූත්‍රවල මේ පිළිබඳව ප්‍රමාණවත් කරුණු දක්නට ලැබේ. මෙම පර්යේෂණ පත්‍රිකාව මගින් විමර්ශනය කිරීමට අපේක්ෂිත වන්නේ පෙළෙහි සැඟවී ඇති බුදුන් වහන්සේගේ සුවිශේෂ නායකත්ව ලක්ෂණ හඳුනා ගැනීම යි. එය කළමනාකරණ ක්‍රියාවලි විෂයයෙහි වැදගත් දායකත්වයක් සපයනු ඇත.

**ප්‍රමුඛ පද :** ත්‍රිපිටකය, නායකත්වය, බුදුන් වහන්සේ, භික්ෂු සංස්ථාව, ශාසනය